**ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය**
**මානව ශාස්ත්‍ර හා සමාජයීය විද්‍යා පීඨය**
**නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව**
**නීතිවේදී උපාධි පාඨමාලාව 2020/2021**
**අවසාන පරීක්ෂණය-තෙවන මට්ටම**
**ශ්‍රී ලංකාවේ නීතිය පිළිබඳ හැඳින්වීමක්-LLU3703/LWU1411**
**කාලය පැය තුනයි (03)**

---

**දිනය: 02..09.2021** **කාලය: පෙ.ව 9.30 සිට ප.ව 12.30 දක්වා.**

---

**මුළු ප්‍රශ්න සංඛ්‍යාව 06 යි**

**ප්‍රශ්න හතරකට 04 ට පිළිතුරු සපයන්න**

**අපැහැදිලි අත් අකුරු සඳහා ලකුණු අඩු කෙරේ**

1. සමන් මහනුවර විදුලිබල මණ්ඩලයේ ඉංජිනේරුවරයෙකු විය. ඔහුගේ දෙමාපියන් පිළිමතලාවේ ස්ථිර පදිංචිකරුවන් විය. සමන්ගේ පියා, රන් බණ්ඩා උඩරැටියකු වූ අතර 1948 දී සමන්ගේ මව වන ඇල්පිටියේ පදිංචිව සිටි ලාලනි සමග දීග විවාහයකට එළැඹුනහ. සමන් එහි සේවය කරමින් සිටින අතරතුර එම සේවා ස්ථානයේම සේවය කරමින් සිටි ගණකාධිකාරිවරියක ලෙස සේවය කළ අමාලි සමග ප්‍රේම සම්බන්ධයක් ආරම්භ කළේය. අමාලිගේ පියා, ජයලත් හික්කඩුවේ පදිංචිකරුවෙකු වූ අතර උඩරට කාන්තාවක වූ ඔහුගේ මව වන බිසෝමැණිකේ සමග විවාහ විය. ඔවුන් ඔවුන්ගේ විවාහය 1960 දී සාමාන්‍ය නීතිය යටතේ සිදු කළ අතර පේරාදෙණියේ වාසය කළහ. අමාලි සහ සමන් ඔවුන්ගේ විවාහය උඩරට නීතිය යටතේ ලියාපදිංචි කිරීමට අපේක්ෂා කරයි.

    **(අ)** සමන් සහ අමාලිට උඩරට නීතිය යටතේ ඔවුන්ගේ විවාහය ලියාපදිංචි කළ හැකිද? **(ලකුණු 15)**

    **(ආ)** අමාලිගේ පියා ඇයගේ මව සමග උඩරට නීතිය යටතේ 1950 දී බින්න විවාහයක් ලෙස සිය විවාහය ලියාපදිංචි කර තිබුණේ නම් ඔබගේ පිළිතුර වෙනස් වන්නේද? **(ලකුණු 10)**

    අදාල ව්‍යවස්ථා සහ අධිකරණ තීරණ ආශ්‍රයෙන් ඔබගේ පිළිතුර සාකච්ඡා කරන්න.

2. කැම්බල් එ. හෝල් (1774) නඩු තීරණය මගින් නියම කරන ලද මූලධර්ම සහ 1799 ප්‍රකාශනය මගින් ශ්‍රී ලංකාවේ පවත්නා නීතිවල අඛණ්ඩතාව තහවුරු කරන ලදි. කෙසේ වුවද ශ්‍රී ලංකාවේ නීති ක්‍රමයට ඉංග්‍රීසි නීතිය ආගන්තුක නීති ක්‍රමයක් වශයෙන් ඇතුළත් විය. එය වෙනස් වූ ආකාර දෙකකට සිදු විය.

    අදාල ව්‍යවස්ථා සහ නඩු තීරණ සමග එම ආකාර දෙක පැහැදිලි කරමින් රචනයක් ලියන්න. **(ලකුණු 25)**

3. මනෝහරන් 1980 දී කැනඩාවේ උපත ලද අතර ඔහුගේ දෙමාපියන් යාපනයේ ද්‍රවිඩ අය වූහ. මනෝහරන්ට වයස අවුරුදු10 දී ඔහුගේ දෙමාපියන් නැවත ලංකාවට පැමිණි අතර යාපනයේ පදිංචි වූහ. ඔහු යාපනය හින්දු විද්‍යාලයට ඇතුළත්ව පාසල් අධ්‍යාපනය සම්පූරණ කළේය. 2000 දී මනෝහරන් නීතිවේදී ප්‍රවේශ විභාගය සමත්ව ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයට ඇතුළත් විය. ඔහගේ උපාධිය සහ වෘත්තීයමය සුදුසුකම් සම්පූර්ණ කිරීමෙන් පසුව ඔහු කොළඹ NCB බැංකුවට නීති නිලධාරියෙකු ලෙස සම්බන්ධ විය. 2007 දී මනෝහරන් එම බැංකුවේම සේවය කළ නීති නිලධාරිනියක වූ අම්රිතා සමග විවාහ විය. අම්රිතා යාපනයේ උපත ලද තැනැත්තියක වූ අතර ඇයගේ දෙමාපියන් ද යාපනයේ ද්‍රවිඩ අය වූහ. ඔවුන්ගේ විවාහයෙන් පසුව ඔවුන් වැල්ලවත්තේ නිවසක් මිලට ගෙන එහි වාසය කළහ. එම විවාහයෙන් ඔවුනට දේවා සහ තාරා යන දරුවන් දෙදෙනකු උපත ලැබූහ. 2012 දී අම්රිතා NCB බැංකුවේ යාපනය ශාඛාවට ස්ථාන මාරුවක් ලද අතර දරුවන් යාපනය බාලිකා විද්‍යාලයට ඇතුළත් කරන ලදි. මනෝහරන් යාපනයේ නිවසක් ඉදි කරන ලද අතර අම්රිතා සහ දරුවන් මනෝහරන්ගේ දෙමාපියන් සමග එම නිවසේ වාසය කළහ. මනෝහරන් NCB බැංකුවේ යාපනය ශාඛාවට ස්ථාන මාරුවක් ලබා ගැනීමට උත්සාහ කළ ද එය අපොහොසත් විය. මනෝහරන් වැල්ලවත්තේ පිහිටි නිවසේ වාසය කළ අතර ඔහුගේ පවුල වෙත නිතිපතා මුදල් යැවීය. ඔහු මසකට වතාවක් ඔහුගේ පවුල බැලීමට යාමට පුරුදුව සිටියේය. යාපනයට යමින් සිටින අතරතුර 2020 දී මෝටර් රථ අනතුරකින් කුරුණෑගල දී මනෝහරන් මරණයට පත් විය.

මනෝහරන් පාලනය වන්නේ තේසවලමේ නීතියෙන් ද නැතිනම් සාමාන්‍ය නීතියෙන් ද යන්න දැන ගැනිමට අම්රිතා ඔබගේ උපදෙස් පතයි. ඇයට උපදෙස් දෙන්න.

මනෝහරන් උපත ලැබුවේ සහ ඔහුගේ පවුල වාසය කළේ මඩකලපුවේ නම් ඔබගේ පිළිතුර වෙනස් වන්නේද? **(ලකුණු 25)**

4. 'ශ්‍රී ලංකාවේ නීති ක්‍රමය තුළ පවතින සෙසු නීති අතර මුස්ලිම් නීතිය වෙනස් ස්වභාවයක් ගන්නා නීතියකි. එයට දිගු ඉතිහාසයක් පවතින අතර සෙසු නීති ක්‍රමයන්ගේ සහ ආගමික මූලධර්මවල බලපෑම සමග එය ක්‍රමයෙන් දියුණුවට පත් විය. කෙසේවෙතත් ශ්‍රී ලංකාවේ පවත්නා නීති පද්ධතිය තුළ මුස්ලිම් නීතියේ සමහර ගැටුම්කාරී අංශ ඇත. මුස්ලිම් නීතියේ පවතින ඇතැම් මතභේදකාරී සංකල්ප වෙනස් කිරීම සම්බන්ධව කථිකාවක් පවතී.'

ඔබගේ මුස්ලිම් නීතිය පිළිබඳ ඇති දැනුම මත පදනම්ව ඉහත ප්‍රකාශය සැළකිල්ලට ගනිමින් "ශ්‍රී ලංකාවේ මුස්ලිම් නීතිය සහ සමකාලීන ගැටලූ" යන මාතෘකාව යටතේ නීති සඟරාවක පළ කිරීම සඳහා ලිපියක් ලියන්න.

ඔබේ ලිපිය අදාල ව්‍යවස්ථා සහ අධිකරණ තීරණ ආශ්‍රයෙන් සකස් කළ යුතුය **(ලකුණු 25)**

5. "එකම අධිකරණ බල ප්‍රදේශයක් තුළ එකිනෙක හා ගැටෙන නෛතික මූලධර්ම සහ සංකල්ප අදාල වන විට නීති අතර ගැටුම් ඇති විය හැකිය. එවැනි ගැටුම් පෞද්ගලික නීති අතර මෙන්ම පෞද්ගලික නීති සහ බලවත් සාමාන්‍ය නීතිය අතර ඇති විය හැකිය. එසේම බලවත් සාමාන්‍ය නීතිය ඇතුළත පවා නීති ගැටුම් ඇති විය හැකිය."

ඉහත ප්‍රකාශය සමග ඔබ එකඟ වන්නේද?

සිද්ධාන්තමය සහ ප්‍රායෝගික දැනුම මත ශ්‍රී ලංකාවේ නීති ක්‍රමය තුළ පවතින බහුවාදයේ ගැටලු ඉහත ප්‍රකාශය ඇසුරින් සාකච්ඡා කරන්න.

මෙම ගැටුම්කාරී තත්ත්වය මගහැරවීම සඳහා ඔබගේ නිර්දේශ ඉදිරිපත් කළ යුතුය.

**(ලකුණු 25)**

6. පහත මාතෘකා පිළිබඳ කෙටි සටහන් ලියන්න.

**(අ)** පූර්ව යටත් විජිත යුගයේ උඩරට රාජධානියේ යුක්තිය පසිඳලීම හා සම්බන්ධවූ නිලධාරීන් සහ ආයතන **(ලකුණු 10)**

**(ආ)** ලන්දේසි යුගය තුළ පැවති අධිකරණ ක්‍රමය **(ලකුණු 05)**

**(ඇ)** වර්තමාන අධිකරණ ධුරාවලිය සහ අධිකරණ වෙත පැවරී ඇති බලතල **(ලකුණු 10)**

- *සියලුම හිමිකම් ඇවිරිණි* -